*සැ. යු.* - (i) 2017.07.21 වැනි දින පළ වූ අංක 2029 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,030 - 2017 ජූලි මස 28 වැනි සිකුරාදා - 2017.07.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1422 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1422 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1430 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1436 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1445 |

*සැ. යු.* - කේ. කේ. පියදස පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අගෝස්තු මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

බර ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 18 ක් සහ සැහැල්ලු ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 16 ක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ප්‍රසම්පාදනය කිරීම

01. බර ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 18 ක් සහ සැහැල්ලු ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 16ක් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතෙහි, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

ලංසුකරුවන්ට ඔවුන්ගේ ලංසු සෘජුවම හෝ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබූ පිළිගත් නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය.

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකාවෙහි කොළඹ 10, ඕල්කට් මාවතෙහි, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ පිටරට දූත මණ්ඩල මාර්ගයෙන්, රු. 1,500 ක ආපසු නොගෙවන ලේඛන ගාස්තුවක් හෝ ඒ හා සමාන පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදලක් ගෙවීමෙන් 2017.08.28 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ලබාගත හැකි පෝර්මවල පමණි.

03. 2017.08.29 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වෙයි.

04. රෝද සහිත ට්‍රොලි ඇක්සල් සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ සැපයීම සිදුකළ යුත්තේ ISO 9001 : 2008 සහතික ලත් සමාගම් හෝ මිලදී ගනු ලබන්නාට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ව කළමනාකරණ ඇති සමාගම් විසින් පමණි.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතෙහි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ලංසු තබන්නන්හට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙසට ආරාධනය කරනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
ඕල්කට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

07. ලංසු ලියකියවිලි පරීක්ෂාකර ගාස්තු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතෙහි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදුකළ හැකි ය.

08. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න :
දුම්රිය ගබඩා අධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථනය : 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් : srs.sir@gmail.com
වෙබ් අඩවිය - www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7481

07-854

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර

### අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙම පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2017.08.17 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.

වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත මගින් තහවුරු කළ යුතු ය.

එච්. එම්. බී. ආර්. විජේරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කළුතර.

2017 ජුනි මස 14 වැනි දින,
කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

## උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 38424 | 205-1994 දරන ත්‍රීරෝද රථය (ලි. ප. කළ නොහැක) |
| 02. | 48476 | WPSL 8254 දරන අත් ට්‍රැක්ටරය (ලි. ප. කළ නොහැක) |
| 03. | 31646 | 45 ශ්‍රී 2266 දරන ට්‍රැක්ටර් ට්‍රේලරය (ලි. ප. කළ නොහැක) 325 - 1580 දරන ට්‍රැක්ටරය (ලි. ප. කළ නොහැක) |
| 04. | 04975 | WPSF - 4463 දරන අත් ට්‍රැක්ටරයක කොටස් (ලි. ප. කළ නොහැක) |
| 05. | 51169 | WPLE - 0091 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 06. | 63470 } 56243 } | 27-2042 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 07. | 96542 | 141-1328 දරන යතුරුපැදිය (ලි. ප. කළ නොහැක) |
| 08. | 83207 | මෝපෙඩ් වර්ගයේ යතුරුපැදිය (ලි. ප. කළ නොහැක) |
| 09. | 54430 | 28 - 6701 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 10. | 43071 | AAF - 6870 දරන ත්‍රීරෝද රථය (ලි. ප. කළ නොහැක) |
| 11. | AR/3498/15 | MU 5105 දරන යතුරු පැදිය (ලි. ප. කළ හැක) |
| 12. | 34693 | මන්න පිහිය |
| 13. | 00597 (BR 6154/12) | මන්න පිහිය |
| 14. | BR/1157/10 | මන්න පිහිය |
| 15. | 49187 ( BR/995/14) | මන්න පිහිය |
| 16. | 49177 ( BR/9923/13) | කැත්තක් |
| 17. | 23266 ( BR/8852/13) | මන්න පිහිය |
| 18. | 44298 ( BR/3131/14) | මන්න පිහිය |
| 19. | 16924 ( BR/8026/13) | කැසට් රේඩියෝ එකයි |
| 20. | 49795 ( BR/3078/14) | සවල් එකයි |
| 21. | 21282 ( BR/7044/12) | කියතක් |
| 22. | 10729 | අත්ට්‍රැක්ටරය පනගන්වන උපකරණය (හැඩලය) |
| 23. | BR/5027/15 | මන්න පිහිය |
| 24. | BR/8986/13 | ලා නිල් පාට කැඩීගිය කම්ප්‍රෙෂර් කොටසක් මෝටරයක් |
| 25. | 92622 | මන්න පිහිය |
| 26. | AR/194/17 | වාහන ටයරයක් |
| 27. | 00064( BR/5409/12) | මල්පෝච්චි 02, අලවංගු 01යි |
| 28. | AR/9102/14 | අලවංගු දෙකයි |
| 29. | AR/2477/15 | වැල්ඩින් කූරු පැකට් 01යි |
| 30. | 40981 | ත්‍රිරෝද රථයක රෝදයක් |
| 31. | 68111 | ලිට්රෝ 2.3 Kg ගෑස් සිලින්ඩරය |
| 32. | BR/102/09 | රූපවාහිනී යන්ත්‍රයක් |
| 33. | AR/4942/16 | කැඩුණු ගුවන් කැමරාවක් |
| 34. | 12129 | රූපවාහිණී යන්ත්‍රයක් |
| 35. | 64796 | යකඩ බාල්දියක් සහ කඹයක් |
| 36. | AR/4943/16 | ගෑස් සිලින්ඩරයක් |
| 37. | 54036 | අඩි 18ක් දිග යකඩ බට 02යි සහ යකඩ පටි කිහිපයක් |
| 38. | AR/5029/16 | PR 264/2016 ඇතුළත් D. S. T. 31 K සඳහන්ව ඇති රතු පැහැති පා පැදිය |
| 39. | PR/265/2016 | ඇතුලත් GIANT ලෙස සඳහන් ව ඇති සුදු, කළු අළු පැහැති සීට් එක නොමැති පා පැදි 01යි |
| 40. | — | PR266/2016 ඇතුළත් FING JAPAN ලෙස සඳහන් නිල්පාට sport පාපැදිය |
| 41. | — | PR267/2016 ඇතුළත් TOMAHWK ලෙස සඳහන් sport නිල් පැහැති ඉදිරිපස කූඩයක් ඇති අළුපාට පාපැදිය |
| 42. | — | PR270/2016 ඇතුළත් ඉදිරිපස කූඩයක් සහිත අළුපාට පාපැදිය |
| 43. | — | PR 268/2016 ඇතුළත් PRECISION ලෙස සඳහන් ව ඇති කළුනිල් පැහැති sport වර්ගයේ පා පැදි 01යි |
| 44. | — | PR 272/2016 ඇතුළත් රතුපාට sport වර්ගයේ පා පැදිය |
| 45. | — | PR 274/2016 ඇතුලත් අළු රතු වර්ණයෙන් යුතු ඉදිරිපස කූඩයක් සහිත පාපැදිය |
| 46. | — | PR 275/2016 ඇතුළත් කළු පැහැති පා පැදිය |
| 47. | — | PR 276/2016 ඇතුළත් LUMAKA ACTIVE ලෙස සඳහන් sport වර්ගයේ පාපැදිය |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 48. | - | PR 277/2016 ඇතුළත් ANQIER ලෙස සඳහන් සුදු, නිල් පැහැති පාපැදිය |
| 49. | - | PR 278/2016 ඇතුළත් කළු පැහැති පා පැදි 01යි |
| 50. | 5029/16 | PR 279/2016 ඇතුලත් නිල් දුඹුරු වර්ණයෙන් යුත් පිටුපස ලාංඡනයක් ඉදිරිපස කූඩයක් සහිත පා පැදිය |
| 51. | - | PR 281/2016 ඇතුළත් LUMAKA SMART නිල් පැහැති sport වර්ගයේ පා පැදිය |
| 52. | - | PR 269/2016 ඇතුළත් TOMAHAWK ලෙස සඳහන් දම්පාට පිටුපස ලැගේජය හා ඉදිරිපස කූඩයක් සහිත පා පැදිය |
| 53. | - | PR 283/2016 ඇතුළත් AMAZON ලෙස සඳහන් පිටුපස ලැගේජය හා ඉදිරිපස කූඩයක් සහිත නිල්, සුදු වර්ණයෙන් යුත් පා පැදිය |
| 54. | - | PR 284/2016 ඇතුළත් TOMAHAWK ලෙස සඳහන් සුදු රතු පැහැති spont වර්ගයේ පා පැදිය |
| 55. | - | PR286/2016 ඇතුළත් ඉදිරිපස කූඩයක් සහිත සුදු පැහැති පා පැදිය |
| 56. | - | PR287/2016 ඇතුළත් ඉදිරිපස කූඩයක් හා පිටුපස ලැගේජයක් සහිත රෝස පැහැති පා පැදිය |
| 57. | - | PR288/2016 ඇතුළත් නිල් රතු පැහැති spont වර්ණයේ පා පැදිය |
| 58. | - | PR290/2016 ඇතුළත් LUMAKA වර්ගයේ කළු පැහැති පිටුපස ලැගේජයක් සහිත පා පැදිය |
| 59. | - | PR291/2016 ඇතුළත් අළු පැහැති sport වර්ගයේ පාපැදිය |
| 60. | - | PR293/2016 ඇතුළත් ATLAS සඳහන් කළු පැහැති පාපැදිය |
| 61. | - | PR294/2016 COYOTE ලෙස සඳහන් දම්පාට පාපැදි 01යි |
| 62. | - | PR295/2016 ඇතුළත් RAYEWELL ලෙස සඳහන් නිල් කහ පැහැති පා පැදිය |
| 63. | - | PR/296/2016 ඇතුලත් කළු පැහැති ප්‍රේම්එක පාස්සන ලද පාපැදිය |
| 64. | - | PR297/2016 ඇතුළත් MAUNTEN වර්ගයේ කළු කොළ පැහැති පාපැදිය |
| 65. | - | PR298/2016 ඇතුළත් කළු පැහැති LUMALA වර්ගයේ පාපැදිය |
| 66. | AR/5103/16 | PR34/2016 ඇතුලත් මඩ්ගාඩ් නොමැති නිල් හා රතු පාට වර්ගය අපැහැදිලි පාපැදිය |
| 67. | 5103/16 | P/02/2016 ඇතුළත් ලුමාලා වර්ගයේ පාපැදිය |
| 68. | - | PR/65/2016 ඇතුලත් TOMOHAWK වර්ගයේ නිල් පාට පා පැදිය |
| 69. | - | PR25/2015 ඇතුළත් පාපැදිය |
| 70. | - | PR159/2015 ඇතුළත් නිකල් මඩ්ගාඩ් සහිත කළු පැහැති හිරෝ පාපැදිය |
| 71. | - | PR132/2016 ඇතුළත් නිල් හා සිල්ව පැහැති පාපැදිය |
| 72. | - | PR178/2016 ඇතුළත් කළු පැහැති පාපැදිය |
| 73. | - | PR40/2016 ඇතුළත් හන්ටර් වර්ගයේ පාපැදිය |
| 74. | - | PR82/2015 ඇතුළත් නිල් පැහැති පාපැදිය |
| 75. | - | PR62/2016 ඇතුළත් TOMOHAWK (මැකී ඇති) වර්ගයේ පැදිය |
| 76. | - | PR101/2015 ඇතුළත් රෝද ඇද වී ඇති පිටුපස බ්‍රේක් පලු ගැලවී ඇති පා පැදිය |
| 77. | - | PR66/2016 ඇතුළත් පිටුපස පමණක් මඩ්ගාඩ් කළුපාට නිල් හා අළුපාට ස්පෝර්ට් පාපැදිය |
| 78. | AR 6996/16 | මවුන්ටන් වර්ගයේ පාපැදිය |
| 79. | AR 5847/16 | PR 58/16 අදාළ කළුපාට පාපැදිය (1348676) |
| 80. | - | PR 49/16 අදාළ ටොමොහොක් වර්ගයේ පාපැදිය |
| 81. | AR 0937/15 | දිරාපත් වෙමින් පවතින පාපැදිය |
| 82. | AR2 208/15 | දිරාපත් වෙමින් පවතින පාපැදිය |
| 83. | කාර්යාල උපකරණ | දිරාපත් වෙමින් පවතින පාපැදිය |
| 84. | AR 5173/16 | මඩ්ගාඩ් නොමැති කළුපාට පාපැදිය |
| 85. | AR 5172/16 | රතුපාට ලුමාලා මවුන්ටන් පාපැදිය |
| 86. | AR 3117/16 | අංකය නොමැති විවිධ නව මවුන්ටන් පාපැදිය |
| 87. | AR 3118/16 | 1150123 සහ කළුපාට වර්ගයක් නොමැති පාපැදිය මඩ්ගාඩ් රහිත පාපැදිය |
| 88. | A 5359/16 | එවරස් වර්ගයේ දුඹුරු කළු පාපැදිය |
| 89. | AR 6819/16 | කළුපාට පාපැදිය |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 90. | AR 6995/16 | අංක AA33833 දරන වර්ගය අපැහැදිලි පාපැදිය |
| 91. | AR 291/17 | පැනසොනික් ලෙස සඳහන් රේසින් වර්ගයේ කොළපාට පාපැදිය |
| 92. | - | කලුපාට නිකල් මඩ් ගාඩ් සහිත පාපැදිය |
| 93. | 11751 | සැටලයිට් රෙකෝඩර් 07ක් |
| 94. | අංක රහිත | යකඩ මුක්කු කොටස් 44ක් |
| 95. | 39903 | ප්ලාස්ටික් බැරල් 17ක් |

07-766

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - රත්නපුර

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

රත්නපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයා ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2017.08.17 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම්, ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.30 - 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට විනාඩි 30 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිළ දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම මුදල් වලින් පමණක් කළ යුතුය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීම සඳහා පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත්කළ යුතුය.

සාලිය චන්න අභයරත්න,
මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු,
රත්නපුර.

2017 ජූලි මස 13 වැනි දින,
රත්නපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 11917 ඒ | හොයිස්ට් මැෂින් 01 යි. |
| 02. | 10565 ඒ | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. |
| 03. | 3426 ඒ | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. |
| 04. | ඒ. ආර්. 679/17 | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. වායු බට 01 යි. |
| 05. | ඒ. ආර්. 273/17 | කොම්ප්‍රෙෂර් ටැංකි 02 යි. කොම්ප්‍රෙෂර් මැෂින් 02 යි. ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 06. | ඒ. ආර්. 843/17 | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. කොම්ප්‍රෙෂර් ටැංකි 01 යි. |
| 07. | ඒ. ආර්. 845/17 | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. |
| 08. | 3422/ඒ | කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. |
| 09. | ඒ. ආර්. 245/16 | හොයිස්ට් මැෂින් 01 යි. |
| 10. | අංක රහිත | අඩි 4 ක් දිග නිල් පාට කොම්ප්‍රෙෂර් ටැංකි 01 |
| 11. | අංක රහිත | කොම්ප්‍රෙෂර් ටැංකි 01 |
| 12. | බී. 240/05 | Swom වර්ගයේ වතුර මැෂින් 01 යි. |
| 13. | අංක රහිත | කොම්ප්‍රෙෂර් ටැංකි 01 |
| 14. | ඒ. ආර්. 18/17 | හොයිස්ට් මැෂින් 01 යි. කොම්ප්‍රෙෂර් මැෂින් 01 යි. |
| 15. | ඒ. ආර්. 545/17 | ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 16. | ඒ. ආර්. 859/17 | ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 17. | ඒ. ආර්. 861/17 | ඔක්සිජන් සිලින්ඩර් 03 යි. |
| 18. | ඒ. ආර්. 1348/16 | ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 19. | බී. 181/17 | ඔක්සිජන් සිලින්ඩර් 03 යි. කුළුගෙඩි 02 යි. |
| 20. | 8231ඒ | ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 21. | අංක රහිත | අඩි 4 ක් දිග ඔක්සිජන් සිලින්ඩර් 01 යි. |
| 22. | ඒ. ආර්. 1266/16 | ජංගම දුරකථන 01 යි. |
| 23. | ඒ. ආර්. 872/16 | ජංගම දුරකථන 01 යි. |
| 24. | ඒ. ආර්. 419/16 | ජංගම දුරකථන 01 යි. |
| 25. | ඒ. ආර්. 332/17 | ජංගම දුරකථන 06 යි. |
| 26. | ඒ. ආර්. 409/17 | ජංගම දුරකථන 02 යි. |
| 27. | බී. 179/17 | ජංගම දුරකථන 02 යි. |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 28. | 12006 ඒ | ජංගම දුරකථන 01 යි. |
| 29. | 12007 ඒ | ජංගම දුරකථන 01 යි. |
| 30. | ඒ. ආර්. 1284/16 | ජංගම දුරකථන 01 යි. |
| 31. | ඒ. ආර්. 845/17 | ජංගම දුරකථන 01 යි. |
| 32. | ඒ. ආර්. 1104/16 | ජංගම දුරකථන 01 යි. |
| 33. | ඒ. ආර්. 1551/16 | ජංගම දුරකථන 01 යි. |
| 34. | ඒ. ආර්. 1351/16 | ජංගම දුරකථන 01 යි. |
| 35. | ඒ. ආර්. 1695/11 | වාහන බැටරි 02 යි. |
| 36. | 11951 ඒ | ගෘහස්ථ ගෑස් සිලින්ඩර් 01 යි, ගෑස් ලිප් 01 යි |
| 37. | 12932 ඒ | ගෘහස්ථ ගෑස් සිලින්ඩර් 01 යි, ගෑස් ලිප් 01 යි |
| 38. | 12794 ඒ | ගෘහස්ථ ගෑස් සිලින්ඩර් 01 යි, ගෑස් ලිප් 01 යි |
| 39. | ඒ. ආර්. 511/17 | බ්ලෝවර් 01 යි. |
| 40. | ඒ. ආර්. 1951/11 | Alpha මුදල් දමන පෙට්ටි 01 යි. |
| 41. | ඒ. ආර්. 1916/14 | බ්ලෙන්ඩර් 01 යි. |
| 42. | ඒ. ආර්. 1174/01 | රබර් බෙල්ට් 12 යි. |
| 43. | ඒ. ආර්. 246/17 | හෙල්මට් 03 යි. |
| 44. | 7307 ඒ | whirlpool දොර දෙක ශීතකරණ 01 යි. |
| 45. | 7133 ඒ | කැති 01 යි |
| 46. | අංක රහිත | හරස් කියත් 07 යි |
| 47. | ඒ. ආර්. 1174/14 | අඩි 15 ක් අඩි 30 ක් දිග කළු පාට බට 02 යි. |
| 48. | ඒ. ආර්. 711/17 | දියයට ගිල්වන වතුර මැෂින් 01 යි. |
| 49. | 11099 ඒ | කුඩා ප්ලාස්ටික් බැරල් 01 යි. |
| 50. | 14557 ඒ | ගෘහස්ථ ගෑස් සිලින්ඩර් 01 යි, ගෑස් ලිප් 01 යි |
| 51. | අංක රහිත | කඹ තොගයක් |
| 52. | අංක රහිත | වාහන බැටරි 05 යි. |
| 53. | අංක රහිත | ඇදුම් පතල් යකඩ ප්ලේට් 11 යි. |
| 54. | අංක රහිත | පතල් දබර යකඩ 04 යි. |
| 55. | අංක රහිත | ඇදුම් පතල් උදළුතල 10 යි. |
| 56. | අංක රහිත | ඇලුමිනියම් කළ 05 යි. |
| 57. | අංක රහිත | ගෙවීගිය උදළුතල 15 යි. |
| 58. | ඒ. ආර්. 1274/15 | සුදුපාට කොමඩ් 01 යි. |
| 59. | අංක රහිත | හිස් බැරල් 08 යි. |
| 60. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ විවිධ හැඩයෙන් යුත් අබලි යකඩ තොගයක්. |
| 61. | අංක රහිත | තහඩු බාල්දි තොගයක් |
| 62. | අංක රහිත | හිස් බෝතල් තොගයක් |
| 63. | අංක රහිත | හිස් බූලි තොගයක් |
| 64. | අංක රහිත | ලොකු ප්ලාස්ටික් බකට් 01 යි. |
| 65. | අංක රහිත | අලවංගු 05 යි. |
| 66. | අංක රහිත | සවල් 10 යි |
| 67. | අංක රහිත | අත් ට්‍රැක්ටර් මඩ වීල් 02 යි. |
| 68. | 74353 | CPU යන්ත්‍ර 01 යි, මොනිටර් 01, කී බෝඩ් 01 යි, මවුස් 01 යි, වූපර් 02 යි. |
| 69. | 74467 | CPU යන්ත්‍ර 01 යි, මොනිටර් 01, කී බෝඩ් 01 යි, කෝඩ් වයර් 02 යි, සබ් වූපර් සෙට් 01 |
| 70. | 31570 | අංක SG VB – 3132 දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය |
| 71. | ඒ. ආර්. 505/16 | අංක WP MH – 5482 දරන යමාටෝ වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කල නොහැක) |
| 72. | 47407 | අංක 141-6302 දරන යමහා වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 73. | 26652 | අංක 104-4507 දරන හොන්ඩා වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 74. | 20649 | ලියාපදිංචි අංකය නැත. බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 75. | 27752 | අංක 115-9916 දරන යමහා වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 76. | ඒ. ආර්. 223/17 | අංක WP MG – 2067 දරන TVS වර්ගයේ යතුරු පැදිය |
| 77. | 77471 | අංක SG HT – 1919 දරන බජාජ් වර්ගයේ ත්‍රීරෝද රථය (ලියාපදිංචි කළ නොහැක) |
| 78. | 95143 | ලියාපදිංචි අංකය නොමැති සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය (ලියාපදිංචි කළ නොහැක) |
| 79. | 30035 | ලියාපදිංචි අංකය නොමැති යන්මාර් වර්ගයේ අත් ට්‍රැක්ටරය (ලියාපදිංචි කළ නොහැක) |
| 80. | 11950 | ගෘහස්ථ ගෑස් සිලින්ඩර් 01 යි, ගෑස් ලිප් 01 යි |
| 81. | ඒ. ආර්. 490/17 | දියයට ගිල්වන වතුර මැෂින් 01 යි. |
| 82. | ඒ. ආර්. 436/17 | හරස් කියත් 01 යි, කුළුගෙඩි 01 යි. |
| 83. | 99049 | විස්ලින් කේට්ල් 01 යි, අවන් 01 යි, ගෑස් කුකර් 01 යි, රයිස් කුකර් 01 යි. |

07-989

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොරටුව

## නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම - 2017

මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2017.09.16 වැනි දින පෙ.ව. 9.30 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් කියන්නන් සිටීනම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට ලිඛිතව ඉදිරිපත් කළ යුතු වේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව එදින පෙ.ව. 9.00 සිට 9.30 දක්වා අතර කාලය තුළ භාණ්ඩ පරීක්ෂාවට ඉඩදෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිලදී ගැනීමේ දී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යවශ්‍ය වේ.

06. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේම අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය.

ඩබ්ලිව්. කේ. ඩී. විජේරත්න,
අතිරේක දිසා විනිසුරු/අතිරේක මහෙස්ත්‍රාත්
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මොරටුව.

2017 ජූනි මස 29 වැනි දින,
මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### මොරටුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණය

*වෙන්දේසි ලේඛනය - 2017*

| *අනු. අංකය* | *නඩු අංකය* | *PR අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 01 | AR 123/16 | 133/16 | කැරළි සහිත රන්මාලයක් |
| 02 | | 135/16 | ජිප්සි කරාබු ජෝඩුවක් |
| 03 | | 136/16 | මැදගලක් අල්ලන ලද රන් මුදුවක් හා කරාබු ජෝඩුවක් |
| 04 | 80820 | - | රන් මාලයක් |
| 05 | AR 599/15 | 1574/15 | මල් කැටයම් සහිත කාන්තා මුදුවක් |
| 06 | AR 600/15 | 1575/15 | රෝස පැහැති ගලක් අල්ලන ලද රන් මුදුව |
| 07 | AR 594/15 | 1609/15 | රන්පැහැති කුඩා කරාබු ජෝඩුවක් |
| 08 | AR 1254/14 | 16/14 | කාන්තා රන් මුදුවක් |
| 09 | AR 1253/14 | 14/14 | කරාබු ජෝඩු 02 ක් |
| 10 | AR 1255/14 | 13/14 | රන් කරාබු ජෝඩු 01 යි, පෙන්ඩන්ට් 01 යි, මුදු 01 යි. |

| *අනු අංකය* | *නඩු අංකය* | *PR අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 11 | AR 1032/13 | 87/13 | රන් මාලයක් |
| 12 | AR 1031/13 | 85/13 | රන් පෙන්ඩනයක් |
| 13 | AR 1033/13 | 86/13 | රන් මාලයක් |
| 14 | 90216 | 66/08 | MOTOROLA වර්ගයේ ජංගම දුරකථනයක් |
| 15 | 97115 | 60/09 | J 132- SONY Ericson වර්ගයේ ජංගම දුරකථනයක් 0772293877 දරන සිම්පත ද සහිතයි. |
| 16 | 82749 | 97/07 | වර්ගය සඳහන් නැති ජංගම දුරකථනයක් |
| 17 | AR 1218/15 | 635/636/637<br>638/639/640<br>641/642/644<br>645/646/647<br>648/649/651 | ජංගම දුරකථන 15 ක් වර්ගය සඳහන් නැත |
| 18 | AR 598/15 | 1563/15 | NOKIA වර්ගයේ ජංගම දුරකථනයක් |
| 19 | AR 86/16 | 3742/15 | Nokiya වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 3743/15 | Greentel වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 3744/15 | k.z.p වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 3745/15 | Micro Max වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 3746/15 | Nokia වර්ගයේ ජංගම දුරකථනයක් |
| 20 | 95075 | 71/09 | ජංගම දුරකථන දෙකක් වර්ගය සඳහන් නැත |
| 21 | 38910 | 610/14 | Nokia වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 611/14 | Do වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 612/14 | AG Tell වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 616/14 | Nokia වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 620/14 | Telego වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 621/14 | Samsung වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 622/14 | Nokia වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 624/14 | Samsung වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 625/14 | Samsung වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 633/14 | Nokia වර්ගයේ ජංගම දුරකථනයක් |
| 22 | 47475 | 3496/15 | ජංගම දුරකථනයක් වර්ගය සඳහන් නැත |
| 23 | AR 601/15 | 1553/15 | වර්ගය සඳහන් නැත ජංගම දුරකථනයක් |
| | | 1554/15 | Samsung වර්ගයේ ජංගම දුරකථනයක් |
| | | 1551/15 | වර්ගය සඳහන් නැත ජංගම දුරකථනයක් |
| | | 1552/15 | වර්ගය සඳහන් නැත ජංගම දුරකථනයක් |
| 24 | AR 602/15 | 389/15 | Do වර්ගයේ ජංගම දුරකථනයක් |
| 25 | AR 603/15 | 284/15 | C C I T වර්ගයේ ජංගම දුරකථනයක් |
| 26 | AR 1485/14 | 878/14 | Sony x Peria වර්ගයේ ජංගම දුරකථනයක් 077-8391426 දරන සිම්පත ද සමග |
| 27 | AR 1486/14 | 1032/14 | Nokia N 1286 වර්ගයේ ජංගම දුරකථනයක් 072-9744379 දරන සිම්පත ද සමග |
| 28 | AR 174/15 | 956/15 | ජංගම දුරකථන 02 යි.<br>ලැප්ටොප් 01 යි.<br>කාන්තා ඔරලෝසු 01 යි. |
| 29 | AR 598/15 | 1563/15 | Nokia වර්ගයේ ජංගම දුරකථන 02 යි.<br>රිදී පැහැති අත් ඔරලෝසුවක් |

| අනු අංකය | නඩු අංකය | PR අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 30 | AR 140/15 | 35/15 | රිදී පැහැති මුදු 02 ක්. |
| 31 | 58230 | 64/17 | වාලම්පූරි 02 ක් |
| 32 | 40620 | 1254/15 | කුඩා වාලම්පූරියක් |
| 33 | 50888 | 179/16 | කතුරක් |
| 34 | BR 1169/14 | 610/14 | කුඩා සීනුවක් |
| 35 | 96441 | 39/09 | B O S C 11 වර්ගයේ ජංගම දූරකථනයක් |
| 36 | BR 1028/10 | 125/10 | පොපර් බටින්ස් පාර්සල් 02 ක් |
| 37 | 90906 | 04/08 | ත්‍රිරෝද රථ කැසට් යන්ත්‍රයක් |
| 38 | AR 1027/15 | 855/15 | හෙල්මට් 02 යි. |
| 39 | 36498 | PR 268/14 | ගේට්ටුවලට සවිකරන පුන්කළස් හැඩයේ යකඩ කැබලි 06 ක් |
| 40 | BR 1818/15 | PR 3749/15 | බඩ්රි වර්ගයේ දුනු තරාදි 01 යි. |
| 41 | BR 1820/15 | PR 3750/15 | කැමර් වර්ගයේ දුනු තරාදි 01 යි. |
| 42 | 52367 | පීආර් 1591/16 | අඟල් 26 Encer වර්ගයේ රූපවාහිනී යන්ත්‍රයක් |
| 43 | 24645 | PR 111/12 | බේබි අවන් එකක් |
| | | PR 196/13 | මෙලෝඩිකාවක් හා ඕගන් එකක් |
| 44 | 90388 | PR 126/11 | National Panasonic කැසට් රෙකෝඩර් යන්ත්‍රයක් |
| | | | ලී ඉරන තල 02 යි. |
| 45 | AR 173/15 | PR 805/14 | වතුර මෝටර් 01 යි. |
| | | | දඩු අඩු 01 යි. |
| | | | අඟල් 02 රිවට් ඇණ 05 ක් |
| | | | ඇලන් කී 05 ක් අඩංගු කට්ටලයක් |
| 46 | 91017 | - | රවුම් කියත් තල 01 |
| 47 | AR 1349/14 | 198/14 | M R F වර්ගයේ ටයර් 01 |
| 48 | AR 1141/14 | 692/14 | ත්‍රිවිල් ටයර් 02 යි. |
| | | | කැසට් රෙකොඩර් 01 යි. |
| | | | වයිපර් මෝටර් 01 යි |
| 49 | 80335 | 83/17 | ඇලෝවීල් 04 යි |
| 50 | 91262 | 181/08 | විදුලි මෝටර් 01 යි |
| | | | වතුර මෝටර් 01යි |
| 51 | 8476 | 180/11 | රෝද පුටුවක කොටස් |
| 52 | 86685 | 168/08 | ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් |
| 53 | 91214 | 17/08 | ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් |
| 54 | 86901 | 171/08 | ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් |
| 55 | 54434 | 513/17 | Litro වර්ගයට අයත් ගෑස් සිලින්ඩරයක් |
| | | | යකඩ ගෑස් ලිප් 02 යි, අඩි 7 1/2 ක් දිග රබර් බටය සහිත |
| | | | රෙගියු ලේටර් 01 යි |
| 56 | 75216 | 98/06 | Dolmar 109 වර්ගයේ විදුලිකියත් 01 යි |
| | | 99/06 | Dolmar වර්ගයේ 69834 දරන විදුලිකියත් 01 යි |
| | | 100/06 | Dolmar වර්ගයේ පීඑස් 6000-2004 (69846) දරන විදුලිකියත් 57 |
| 57 | 22315 | 49/13 | සවලක් |
| 58 | 88970 | 194/08 | සවලක් |
| 59 | 26256 | 39/13 | සවලක් |
| 60 | 88964 | 188/08 | තාච්චියක් |
| 61 | 88965 | 189/08 | තාච්චියක් |

| අනු අංකය | නඩු අංකය | PR අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 62 | 88968 | 192/08 | තාච්චියක් |
| 63 | 99161 | 149/10 | ඇළුමිනියම් බාල්දියක් |
| 64 | 99164 | 148/10 | ඇළුමිනියම් බාල්දියක් |
| 65 | 82823 | 35/07 | අඟල් 20 ක් පමණ දිග යකඩ බටයක් |
| 66 | 92899 | 200/09 | 2x2 පොල්ලක් |
| 67 | AR 766/16 | 878/16 | කළු පැහැති ලගේජය සහිත පා පැදියක් |
| 68 | AR 864/15 | 2513/15 | ලුමාලා වර්ගයේ නිල් පාට මැද පොකට් සහිත පාපැදියක් |
| 69 | AR 863/15 | 2512/15 | කළුපාට සීට් කවරයක් සහිත පා පැදියක් |
| 70 | AR 861/15 | 2510/15 | ටොම් පෝක් වර්ගයේ නිල් සුදු මිශ්‍ර පාපැදියක් |
| 71 | AR 860/15 | 2509/15 | කොන්ටත් වර්ගයේ පා පැදියක් |
| 72 | AR 859/15 | 2508/15 | ටොම් පෝක් වර්ගයේ කළුපාට පාපැදියක් |
| 73 | AR 858/15 | 2507/15 | Reaper ලෙස සඳහන් ළමා පා පැදියක් |
| 74 | AR 857/15 | 2506/15 | ලුමාලා වර්ගයේ කළු පාට සීට් කවරයක් සහිත පා පැදියක් |
| 75 | AR 856/15 | 2505/15 | දුඹුරුපාට සීට් කවරයක් සහිත කළුපාට පා පැදියක් |
| 76 | AR 573/15 | 533/15 | සුදු, කළු, දම්පාට මිශ්‍ර මවුන්ටන් වර්ගයේ පා පැදියක් |
| 77 | AR 1037/13 | 74/12 | වර්ගය අපැහැදිලි පා පැදියක් |
| 78 | AR 1036/13 | 15712 | වර්ගය අපැහැදිලි පා පැදියක් |
| 79 | 54391 | PR 2143/16 | යකඩ බැරල් 03 යි |
| 80 | 55859 | - | EINHELL වර්ගයේ යතු මැෂින් 01 යි |
| 81 | නඩු අංක රහිත | - | ඇළුමිනියම් වළං 06 යි |
| 82 | නඩු අංක රහිත | | කොම්ප්‍රෙෂර් යන්ත්‍ර 02 යි |

07-765

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2018 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත් ව 2018 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම් සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2017 අගෝස්තු මස 16 වැනි දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර, නියමිත ආකෘති පත්‍රයෙන් යුතු ටෙන්ඩර් පෝරමයකින් විය යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබාගන්නා ලද නිල කුවිතාන්සිය, සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතික ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඇ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිළිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එහි සඳහන් ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් පෝර්මය සමග පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර දැමිය යුතු ය. තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීම සඳහා නියමිත වේලාව ඉක්මවීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එහි සඳහන් වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩර්පතක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවළුන් පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, ඒවා 2017.09.22 වැනි දින පෙරවරු 10.30ට මෙම ස්ථානයේ දී විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම්, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2017 ජූලි මස
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුි වියයුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| අංක 05 | පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2017.08.16 පෙ. ව. 10.30 | 5,000.00 |

07-998

---

**නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018 වර්ෂය**

2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2017 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ.ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළ දී ගැනීම සඳහා ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැළැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2017 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 3.00 ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2018 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2018 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

08. 2017 සැප්තැම්බර් මස 06 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2017 ඔක්තෝබර් මස 24 වැනි දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. එම්. පෙත්තාවඩු,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2017 ජූලි මස 10 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *රා තැබෑරුම විවෘත කර තබන වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2017.09.06 පෙ.ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 - රාත්‍රී 8.00 දක්වා |

07-990

---

## කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018

2018 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස් විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2017 සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 10.30 දක්වා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියමිත කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සරප් වෙතින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දැක්වෙන *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එය මුද්‍රා තබා එහි මුදුණේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය ද, නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතුය. නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකිය.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයක් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය 2017 සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 10.30 තෙක් පමණි. සියලුම ටෙන්ඩර්කරුවන් මෙදින එම වේලාවට මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

කිසිම කරුණු දැනුම් දීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

තනි වරප්‍රසාද ලබා ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන ලද දින පස්වරු 2.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂක ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

2018 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථාන ලබා දීමට සහතිකවනු නොලැබේ. දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2018 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් වෙනත් ස්ථානයක යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

2017 සැප්තැම්බර් මස 04 වැනි දින රේන්ද විකිණීමෙහි ලා සතුටුදායක ඉල්ලීමක් නොතිබුණහොත් 2017 ඔක්තෝබර් මස 27 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මෙම ස්ථානයේ දී ම පවත්වනු ලැබේ.

වැඩි විස්තර අවශ්‍ය වේ නම් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2017 ජූලි මස 4 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම - 2018**

| අංකය හා නම | පත්තුව | තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් වසන දිනය හා වේලාව | තැබෑරුම විවෘත කළ යුතු වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|---|
| අංක 02 කුරුණෑගල | වැලඩ විල්ලි හත්පත්තුව | නාගරික කොට්ඨාසය අංක 01, 09, 10, 11, 12 | රු. 3,000 | 2017 සැප්තැම්බර් 04 දින පෙ. ව. 10.30 දක්වා | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

07-789

## ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය

### 2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුණේ වම් කෙළවරෙහි "අංක.................... දරන............................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2017.09.20 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ජා ඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2017.09.20 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2017.11.21 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

දුරකථන අංකය : 011- 2236428.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
ජා ඇල.

මගේ අංකය : ජා/1/7/02/06.
2017 ජූලි මස 01 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජා-ඇල.

**උපලේඛනය**

| අනු. අංකය | කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2017.09.20 පෙ.ව. 10.30 | 1,500.00 |
| 02 | එම | වැලිගම්පිටිය | එම | 1,500.00 |
| 03 | එම | කණුවන | එම | 4,000.00 |
| 04 | එම | මඩමවත්ත ඒකල | එම | 5,000.00 |
| 05 | එම | දඬුගම | එම | 1,000.00 |

07-767

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යුනිවර්සල් ලයිෆ් චේන්ජර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123649
ලියාපදිංචි කළ දිනය : 2017 ජූලි 6
ලියාපදිංචි කාර්යාලය : අංක 32/6, කොඩිකාම පාර, නෙල්ලියඩි, කරවෙට්ටි.

සමාගම් ලේකම්.

07-769

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පරපරපු මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123650
ලියාපදිංචි කළ දිනය : 2017 ජූලි 6
ලියාපදිංචි කාර්යාලය : අංක 46, මාවඩි පටුමග, සුදුමලයි දකුණ, මානිප්පායි.

සමාගම් ලේකම්.

07-771

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පොදු සමාගම ස්ථාපිත කරන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඕෂද ඉන්වෙස්ට්මන්ට් එල්ටීඩී
සමාගමේ අංකය : පී බී 5363
ලියාපදිංචි කාර්යාලය : අංක 224/බී, හීන්කැලේ වත්ත, මූදුකටුව, මාරවිල.

සමාගම් ලේකම්.

07-772

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පෞද්ගලික සමාගම 2017 මැයි මස 08 වැනිද පිහිටුවන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : මල්වත්ත හෝල්ඩිංස් පෞද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 122125
ලියාපදිංචි කාර්යාලය : අංක 119, ගම්පොල පාර, උලපනේ.

සමාගම් ලේකම්.

07-774

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : හෙලෝ කැබ්ස් ලංකා (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 123374
සංස්ථාගත කළ දිනය : 2017.06.23
ලියාපදිංචි කාර්යාලය : අංක 123, මීගමුව පාර, කුරුණෑගල.

සමාගම් ලේකම්.

07-775

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින

30 ක් ඇතුලත දී නොගෙව්ව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම සහ වෙනත් අදුළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 0114667218, 0112565573

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක ඃ 081-2210595, 071- 8446374.

07-961

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 17 වන දින ප.ව 02.30 ට දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව නගර සභා සීමාවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හොන්නන්තර උතුර අංක 13 ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල හොන්නන්තර පිහිටි ශ්‍රී විජයනන්දනාරාම පාර, වරිපනම් අංක 171/5 දරන දවටගහවත්ත නැමැති ඉඩම බෙදු වෙන් කළ ලොට් 2ඒ දරන බලයත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද වර්ෂ 2014/07/01 දිනැති පිඹුරු අංක 9053 දරන පිඹුරේ දැක්වෙන ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය අඃ0, රූඃ0, පර්ඃ10.00

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2016/03/10 දිනැති අංක 871 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම කංකානමගේ දෝන රම්‍යා කබ්රාල් ජයවර්ධන බන්ධනදයී/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - වර්ෂ 2017 ජූලි මස 07 වන දින *රජයේ ගැසට් පත්‍රයද*, ලක්බිම, දි අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- කොළඹ සිට කොළඹ කැස්බෑව පාරේ මිරිස්වත්ත හන්දිය දක්වා ගොස් වමට හැරී එතැන් සිට මීටර් 800 ක් පමණ ගමන් කළ විට දකුණු පසින් ඇති විජයවර්ධනාරාම පාර දක්වා ගොස් එතැන් සිට මීටර් 700 ක් පමණ ගිය විට වම් පසින් දේපල පිහිටා ඇති අතර ඉඩමේ මායිම වටරවුම සහිත අඩි 15 පළල බොරලු පාරට මුහුණලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසි අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙක හමාරක්)
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000),
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්ව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම සහ වෙනත් අදුළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 0114667218, 0112565573

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ බලයත් වෙන්දේසිකරු,

අංක 182/3, (50/3) විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක ඃ 0113068185, 2572940

07-958

## පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශ්‍රී ලංකා ජනරජයේ නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුලත, පානමෙයි පත්තුවේ, පොතුවිල් හි අංක පී/25 දරන ග්‍රාම නිලධාරී වසමේ ඌරනි ග්‍රාමයේ, පිහිටි බෙද වෙන් කොට මායිම් දක්වා ඇති "ඌරනි කාඩු" නැමැති, ඉඩමට අදළව බලයලත් මිනින්දෙරු පී. තාමෙන්ද්‍රන් විසින් පිළියෙල කළ වර්ෂ 2013 ක් වූ ජනවාරි මස 01 වන දිනැති අංක 03/2013 දරන මැනුම් පිඹුරේ ලොට් අංක 1 වශයෙන් නිරූපිත වූ ඉඩම, අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 01/18 යටතේ ලියාපදිංචි කර ඇත.

විශාලත්වය අ:3-රූ:0-පර්:0
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 18 වන දින පෙ.ව 10.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය*.- පොතුවිල් නගරයේ සිට අක්කර පත්තු පාර දිගේ අංක 326/1 ඌරනි පාලම පසුකර කි. මී. 6 ක් පමණ ගොස් දකුණට හැරී බොරළු පාර දිගේ තුන්මන් හන්දිය තෙක් කි. මී. 1/2 ක් පමණ ගමන් කර දකුණට හැරී වම්පස ඇති විස්කි බේ සර්ෆ් ඇන්ඩ් පේපර් මූන් කුඩිල්ස් නමින් හඳුන්වන හෝටල් වලට කෙලින් ඇති බොරළු පාර තෙක් කි. මී. 0.8 ක් පමණ ගමන් කරන්න. එහි සිට වමට හැරී පටුමග දිගේ මීටර් 300 ක් පමණ ගමන් කරන්න. එකී පාරේ දකුණු අත පැත්තට වන්නට අදල දේපල පිහිටා ඇත.

විස්කි පොයින්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනධායී" ලෙස ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් සහ පී. එස්. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.06.12 දිනැති අංක 21169/5541 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය .-වර්ෂ 2017.07.06 වන දින තිනක්කුරල්, දි අයිලන්ඩ්, ලක්බිම පුවත්පත් සහ වර්ෂ 2017.07.07 වැනි දින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්)
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙක හමාරක්)
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්ව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකः 0114667412

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595, 071-4755974, 071-4962449

07-957

---

## පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපල වෙන්දේසිය

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ සහ දක්වා ඇති වේලාවේදී එකී දේපල පිහිටි සථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර පල්ලේසිය පත්තුවේ, වගපනහ දූන් දඹුල්ල නගර සභා සීමාවේ, සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගොල්ලාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල තිත්තවල්ගොල්ලේ පිහිටි අභයවත්ත සහ මොරගොල්ලැව නැමැති ඉඩම් ඒකාබද්ධ කර බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් සාදන ලද 2014.09.29 දිනැති අංක 9891 දරන පිඹුරේ ලොට් 1 යනුවෙන් දක්වෙන (බලයලත් මිනින්දෝරු යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන විසින් මැන සාදන ලද පිළිවෙලින් 1999.01.16 සහ 1999.01.14 දිනැති අංක 275 දරන පිඹුරෙහි ලොට් 1 සහ අංක 273 දරන පිඹුරෙහි ලොට් 2 යනුවෙන් දක්වෙන) දරන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දෙයද වේ.

විශාලත්වය අ. 02, රූ.01, පර්.26
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 21 වන දින ප.ව 02.00ට

සයිබා එන්ටර්ප්‍රයිසස් හි හවුල්කරුවන් වන එඩරුතැන්නෙ ගෙදර ජමල්ඩීන් සලීම්ඩීන් සහ වැලිමංකඩගෙදර මොහොමඩ් රාසික් මොහොමඩ් රිල්ෂාඩ් යන අය බන්ධනාදයීන් ලෙස ද, එඩරුතැන්න ගෙදර ජමල්ඩීන් සලීම්ඩීන් උකස්කරු ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් වී. සී. ද ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.03.18 දිනැති අංක 1081 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - වර්ෂ 2017.07.07 වන දින ලක්බිම, දි අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් සහ එදින ගැසට් පතද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය .-* දඹුල්ල නගරයේ සිට මහනුවරට යන A9 පාර ඔස්සේ, කි. මී. 5.3 ක් පමණ A9 මහා මාර්ගය 68 වන කි. මී. කණුව දක්වා ගොස් එම පාරේම තවත් කි. මී. 0.7 ක් පමණ ගොස් දකුණට ඇති පොදු මාවතේ, යා යුතුය. එම පාරේ මීටර් 300 ක් පමණ ගිය විට විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසි අවසාන වූ විගස ගැණුම්කරු එවේලේම පහත සඳහන් වියදම් මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැනුම් මුදලෙන 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ද (සියයට දෙක හමාරක්)
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000),

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්ව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකː 0114667218

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595, 071- 8446374.

07-962

---

**පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 17 වන දින පෙ.ව 10.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්ගොඩමුල්ල බටහිර අංක 62 ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල කෝන්ගොඩමුල්ලේ පිහිටි ස්ර්වේයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද අංක 510086 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 03 හි දක්වෙන කැබලි අංක 0235 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි නවයයි බින්දුවයි එකක් (හෙක් 0.1901) විශාලත්වය ඇති මීගමුව හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ

හිමිකම්/වෙළුම්/අංක 0004498 ගම්පහ හි ලියාපදිංචිව ඇති ඉඩම වේ.

විශාලත්වය හෙක්ටයාර් 0.1901

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් සහතික කරන ලද වර්ෂ 2015.07.20 සහ 2015.12.14 වැනි දිනැති අංක උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම කඳවල අයන් එන්ජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයින් වශයෙන් ද, කළුබෝවිල ගුණසේකරලාගේ දොන් ක්‍රිෂාන්ත සංජීව ගුණසේකර උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2017 ජූලි මස 07 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, ලක්බිම, දි අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- මීගමුව නගර මධ්‍යයේ සිට කොටදෙණියාව පාර ඔස්සේ කි. මී. 10.3 ක් ඉදිරියට දෙල්ගස් හන්දිය දක්වා ගොස් 11/1 බෝක්කුව පසුකල විගස දකුණට ඇති ගමේ කඩේ හෝටලය අසලින් දිසාගෙවත්ත පාරට හැරෙන්න. එතැන සිට කි. මී. 1.3 පමණ ගොස් වමට ඇති ආරිය මාවතට හැරී මීටර් 600 ක් පමණ යා යුතුය. එතැනින් දකුණට ඇති සමගි මාවතේ මීටර් 100 පමණ ගොස් නැවත දකුණට හැරී මීටර් 50 ක් පමණ ගිය විට එම පාරේ දකුණු පසින් පාරට මුහුණ ලා දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවේලේම පහත සඳහන් වියදම් මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැනුම් මුදලෙන් 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ද (සියයට දෙක හමාරක්)
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්ව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 0114667218, 0112565573

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ බලයත් වෙන්දේසිකරු.

අංක 182/3, (50/3) විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 2572940

07-960

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මතුගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

**තුන්වන උපලේඛනය**

1 අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007.08.19 දින සාදන ලද පිඹුරු අංක 226 හි දක්වෙන බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලේ, දකුණු මහ පත්තුවේ, කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලේවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් පස්බිම් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙද වෙන් කර ලොට් A ලෙස ලකුණු කර ඇති බිම් කොටස,

ප්‍රමාණය (අක්. 8, රූඩ්. 0, පර්.0) හෝ හෙක්ටයාර් 3.2374

2 අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007.08.19 දින සාදන ලද පිඹුරු අංක 226 හි දක්වෙන බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලේ, දකුණු මහ පත්තුවේ, කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලේවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් පස්බිම් සහ එහි

පවත්නා සියලු දේත් සමග බෙද වෙන් කරන ලද ලොට් B ලෙස ලකුණු කර ඇති බිම් කොටස.
ප්‍රමාණය (අක්:1 රූඩ්:2 පර්:31.1) හෝ හෙක්ටයාර් 0.6858

3 අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007/08/19 දින සාදන ලද පිඹුරු අංක 226 දරන පිඹුරෙහි දක්වෙන බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලේ, දකුණු මහ පත්තුවේ, කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලේවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් පස්බිම් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙද වෙන් කරන ලද ලොට් D ලෙස ලකුණු කර ඇති බිම් කොටස
ප්‍රමාණය (අක්. 0, රූඩ්.1, පර්.0) හෝ හෙක්ටයාර් 0.1011

පහත සඳහන් පරිදි මාර්ග වෙන්කිරීම් තුලින් උඩින් සහ ඔස්සේ යාමේ අයිතියද සමඟ වේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ දකුණු මහපත්තුවේ කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලේවිලදෙණිය කියන ඉඩමෙන් බෙද වෙන්කරන ලද ලොට් C - (අඩි 16 ක් පළල පාරක් සඳහා වෙන්කර ඇත) ප්‍රමාණය (අක්.0 රූඩ්.1 පර්.27.9) හෝ හෙක්ටයාර් 0.1717

ලොට් 14A - (පාරක් සඳහා වෙන්කර ඇත)
ප්‍රමාණය (අක්. 0, රූඩ්. 0, පර්. 11)

හතරවන උපලේඛනය

*මාදිලිය* : තන්ටා 7144T පෙළ තේ පාට තෝරන්නා
*විස්තරය :* බකට් එලවේට(ර්) ෆීඩ් හොප(ර්) තෘ කන්වේය(ර්) සහ නියමිත අමතර කොටස්ද සමඟය.

තුන්වන උපලේඛනයේ සඳහන් දේපළ ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දෙන් උපසේන රූපසිංහ ජයවර්ධන ණයකරුවන් හැටියටද "සම්රෝ ටී ෆැක්ටරි" යන නාමයෙන් සහ විලාශයෙන් තනි අයිතිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගිහාන් නිරෝෂන් ජයවර්ධන ණයකරු හැටියටද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට උකස්කර ඇත.

හතරවන උපලේඛනයේ සඳහන් දේපළ ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දෙන් උපසේන රූපසිංහ ජයවර්ධන ණයකරුවන් හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට උකස්කර ඇත.

3 වන උප ලේඛනයෙහි සඳහන් 1, 2 සහ 3 දේපළ වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 21 වැනි දින පෙ.ව. 11.30 ට

4 වන උප ලේඛනයෙහි සඳහන් යන්ත්‍රෝපකරණ වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 21 වන දින ප.ව. 12.00 ට

එම දේපළ පිහිටි ස්ථානය වන කළුතර දිස්ත්‍රික්කයේ කෙවිටියාගල පල්ලේවිලදෙණිය යන ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.07.02 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.11.22 දින ලක්බිම, ද අයිලන්ඩ් හා වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.07.28 වන දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2017.07.28 දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

3 වන උපලේඛනයේ 1, 2 සහ 3 සහ 4 වන උපලේඛනයේ දේපළවලට පිවිසීම

මතුගම - පැලවත්ත පාරේ ගියවිට පොල්ගම්පල කඩවීදිය හමුවේ. එතැනින් දකුණට හැරෙන විට හමුවන බොරලු සහිත පාරේ මීටර් 250ක් පමණ ගියවිට වම්පසින් හමුවන ආරක්ෂක කුටිය ළඟින් මීටර් 200ක් පමණ පහලට යනවිට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය* .- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2000/- (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/- (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරන වියදම් (07) ගැණුම්කරු විසින් අකාලිත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මතුගම ශාඛාවේ තැන්පත් කළ යුතුය. හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන්, පී. එල්. සී,
අංක 99, කළුතර පාර, කළුතර පාර,
මතුගම.
දුරකථන 034-2249470-2
ෆැක්ස් 034-2249473

07-911

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මීරිගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ දසියා පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැවගෙදර ග්‍රාම නිළධාරී වසමේ දිවුලපිටිය හි පිහිටි "කටුවේහේන" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K. කන්නන්ගර විසින් 2003 නොවැම්බර් 19 දින සාදන ලද අංක 1120/2003 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ඉඩමට.

ප්‍රමාණය පර්චස් විසිදෙකයි දශම අට (අ. 0, රූඩ්. 0, පර්.22.8) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

**දෙවන උපලේඛනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල පිටිගල් කෝරළේ කටුගම්පොල හත් පත්තුවේ පහළ මාකඳුර කටුගම්පොළ හි පිහිටි දික්පිල්ලෑව නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු R. A. චන්ද්‍රරත්න විසින් 1998 අප්‍රේල් 30 වැනි දින සාදන ලද අංක 1785 දරන පිඹුරේ ලොට් 1 දරන

ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් පහළොවයි (අ. 0, රූ. 2, පර්.15) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

**තුන්වන උපලේඛනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල පිටිගල් කෝරළේ කටුගම්පොල හත් පත්තුවේ ඉහළ මාකඳුර හි පිහිටි දික්පිල්ලෑව වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු S.B. අබේකෝන් විසින් 2004 අගෝස්තු 20 වන දින සාදන ලද අංක 7855 දරන පිඹුරේ ඉඩම

ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් හයයි දශම පහ (අ:0, රූ:2, පර්:6.5) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

**හතරවන උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ දසියා පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොම්බුගම්මන 97A ග්‍රාම නිළධාරී වසමේ බොම්බුගම්මන ගමේ හි පිහිටි "කහටගහවත්ත හෙවත් මිල්ලගහලන්ද" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු S. සෙනරත් විසින් 2005 මාර්තු 30 දින සාදන ලද අංක 2582 දරන පිඹුරෙන් බෙද වෙන්කරන ලද ලොට් 1 දරන

ප්‍රමාණය පර්චස් එකයි දශම අටයි දෙක (අ:0 රූ:0 පර්:1.82) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර හෙවත් වළන්ගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට උකස් කරන ලද ඉහත 1, 2, 3 සහ 4 උපලේඛනවල සඳහන් දේපළ

1 වන උපලේඛනයෙහි සඳහන් දේපළ (පර්:22.8)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 18 වැනි දින පෙ.ව. 11.00 ට

4 වන උපලේඛනයෙහි සඳහන් දේපළ (පර්:1.82)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 18 වැනි දින පෙ.ව. 11.30 ට

3 වන උපලේඛනයෙහි සඳහන් දේපළ (රූ:2 පර්:6.5)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 18 වැනි දින ප.ව. 1.00 ට

2 වන උපලේඛනයේ සඳහන් දේපළ (රූ:2 පර්:15)
වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 18 වැනි දින ප.ව. 1.30 ට

මා විසින් ඉහත ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017/06/23 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017/07/28 වන දින රජයේ ගැසට් පත්‍රය සහ 2017/08/01 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම :-*

1 වන උපලේඛනයේ සඳහන් දේපළ :

දිවුලපිටිය ඔරලෝසු කණුව ලඟ සිට මීනුවන්ගොඩ පාරේ මීටර් 100 ක් පමණ ගියවිට අදළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

2 වන උපලේඛනයේ සඳහන් දේපළ :

මාකඳුර හංදියේ සිට කුලියාපිටිය පාරේ මීටර් 900 ක් පමණ ගමන් කර දකුණට හැරුණු විට ඇති වාහන ගමන් කළ හැකි බොරළු පාරේ මීටර් 150 ක් ගමන් කළවිට අදළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

3 වන උපලේඛනයේ සඳහන් දේපළ

මාකදුර හංදියේ සිට කුලියාපිටිය පාරේ මීටර් 900 ක් පමණ ගමන් කර දකුණට හැරුණු විට ඇති වාහන ගමන් කළ හැකි බොරළු පාරේ මීටර් 75 ක් ගමන් කළ විට අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

4 වන උපලේඛනයේ සඳහන් දේපළ

මිනුවන්ගොඩ ඔරලෝසු කණුව ළඟ සිට මිනුවන්ගොඩ පාරේ මීටර් 20ක් පමණ ගිය විට අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මීරිගම ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකතන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන්, පී. එල්. සී,
අංක 93, ගිරිඋල්ල පාර,
මීරිගම.
දුරකතන අංකය : 033-2274312 -3
ෆැක්ස් අංකය : 033- 2274314.

07-913

HNB 241-16

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. ත්‍රිකුණාමලය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරිකුමාරනාදන් විසින් සහතික කරන ලද්ද වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්ද වූ ද, 1995 දෙසැම්බර් මස 18 වැනි දින සහතික කළ අංක 276, 1996 ජූලි 18 දින සහතික කළ අංක 346, 1999 පෙබරවාරි 14 දින සහතික කළ අංක 1017, 2003 ජූලි මස 28 වැනි දින සහතික කළ අංක 1979, 2006 ඔක්තෝබර් 19 දින සහතික කළ අංක 3083, 2010 ජූලි මස 02 වැනි දින සහතික කළ අංක 3745, 2011 සැප්තැම්බර් මස 14 වැනි දින සහතික කළ අංක 4034, 2012 අගෝස්තු මස 24 වැනි දින සහතික කළ අංක 4346 සහ 2015 අප්‍රේල් මස 10 වැනි දින සහතික කළ අංක 4846, දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෝ හෝක් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017 ක් වූ අගෝස්තු මස 30 වැනි දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ*.- (1) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල නගරසභා කඩවත් උපදිසාපති කොට්ඨාසයේ ත්‍රිකුණාමල හස්කිසන් වීදියේ පිහිටි ත්‍රිකුණාමලයේ බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ආර්. මුරුගුපිල්ලේ විසින් මැන සාදන ලද 1960 ජනවාරි මස 20 වැනි දිනැති අංක 388 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් බෙද වෙන් කළ පර්චස් 37.15 ක විශාලත්වය ඇති ඉඩමෙන් බෙද වෙන් කළ පර්චස් 00.94 ප්‍රමාණයැති ඉඩම් කොටස.

(2) ඉහත කී පිඹුරු අංක 388 හි ගිණිකොන පෙදෙසෙහි ලොට් ඒ හි වයඹ දෙස කොටස, පහත සඳහන් අංක 727 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දක්වෙන ගිණිකොන පෙදෙසෙහි වයඹ දෙසට ඇති කොටස සඳහා මායිම්ව ඇති විශාලත්වයෙන් (අ:0, රූ:0, පර්:00.62) යුතු ඉඩම.

(3) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල නගරසභා කඩවත් කොට්ඨාසයේ ත්‍රිකුණාමල හස්කිසන් වීදියේ 6 වන කොට්ඨාසයේ පිහිටි ත්‍රිකුණාමලයේ බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ආර්. මුරුගපිල්ලේ විසින් 1960 නොවැම්බර් මස

29 වන දිනැති සාදන ලද අංක 388 දරන පිඹුරේ ලොට් බී වශයෙන් බෙද වෙන් කළ පර්චස් 2.45 ක විශාලත්වය ඇති ඉඩම.

(4) ඉහත සඳහන් අංක 388 දරන පිඹුරේ ලොට් සී වශයෙන් බෙද වෙන් කරන ලද ඉඩමට මායිම් වූ පර්චස් 2.80 විශාලත්වයෙන් වූ ගොඩනැගිලි සහ ඉඩම.

(5) ඉහත සඳහන් ප්‍රදේශයේම පිහිටි අංක 388 දරන පිඹුරේ ලොට් ඩී වශයෙන් දක්වෙන බෙද වෙන් කරන ලද පර්චස් 11.60 ඉඩම (ත්‍රිකුණාමලයේ බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එස්. වේළුපිල්ලේ විසින් 1981 ඔක්තෝබර් මස 21 වැනි දින සාදන ලද අංක 727 දරන පිඹුරේ ලොට් ඩී1 වශයෙන් සහ බලයලත් මිනින්දෝරු එස්. ගෝපාලක්‍රිෂ්ණන් විසින් 1984 අප්‍රේල් මස 03 වැනි දින සංශෝධනය කළ) (කළු තීන්තෙන් ඇති ඩී1 රතු තීන්තෙන් නැවත බෙදන ලද ඩී1 සහ ලොට් ඩී 1 සහ ඩී 2 වශයෙන් බෙද වෙන්කරන ලද ඉතිරි කොටසින්ද) මායිම් වූ ලොට් ඩී1 වශයෙන් රතු පාටින් දක්වා ඇති ඉතිරි කොටස විශාලත්වයෙන් පර්චස් 11.60 න් පර්චස් 1.56 අඩු කොට (ලොට් ඩී2) පර්චස් 10.4 ක් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016 නොවැම්බර් මස 25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2016 දෙසැම්බර් මස 09 වැනි දින ලක්බිම, තිනක්කුරල්, ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- ත්‍රිකුණාමල ප්‍රසිද්ධ බස්නැවතුම් පොළේ සිට මහවීදියේ මීටර් 200ක් පමණ ඉදිරියට ගමන් කර එතැනින් වමට හැරී හස්කිසන් වීදියේ මීටර් 50 පමණ දුරක් ගිය විට අදාළ දේපළ වම් අත පැත්තේ හස්කිසන් පාරට මායිම්ව වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැනුම් මුදලේ සියයට දහයක් ද (10%),
(2) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් ද 1%,
(3) වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
(4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු.2000) ද,
(5) ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
(6) සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මුදලෙන් සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් අදළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - (ණය අධීක්ෂණය සහ අය කිරීම) හැටන් නැෂනල් බැන්ක් පී එල් සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකතන අංකඃ 2661826, 2661835 ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර, කොළඹ 12.
දුරකතන අංක : 0777-378441/ 071 -4424478/ 0112-509442
ෆැක්ස් අංක : 0112- 509442.

07-969

---

HNB 249 -17

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. -තඹුත්තේගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ.)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2013 අප්‍රේල් මස 30 වැනි දික සහතික කළ අංක 46 දරන බැඳුම්කරය සහ අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ.වී. ඒ. දිසානායක විසින් 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සහතික කළ අංක 8182 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම රත්නායක මුදියන්සේලාගේ කිත්සිරි බණ්ඩාර රත්නායක සහ විජේතුංග මුදියන්සේලාගේ සෝමාවතී ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017 ක් වූ අගෝස්තු මස 30 වැනි දින ප.ව. 2.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගම 381 ග්‍රාම නිලධාරි වසමේ මැදගම ගමෙහි පිහිටි සර්වෙයර් ජෙනරාල් විසින් සාදන ලද අංක 110101 දරන කැබැස්තර පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 610 දරන ඉඩම් කොටස හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි හතයි දෙකයි බිංදුව (හෙක්ටයාර් 0.2720)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල ගහකොල වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.06.16 දින රජයේ *ගැසට් පත්‍රය* හා 2017.06.23 දින ලක්බිම, තිනකුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- තඹුත්තේගම - කැකිරාව පාරේ එප්පාවල නගරය පසු කොට ඇඳගල නගරය ද පසු කොට කි.මී. 1 1/2ක් පමණ ගිය විට මැදගම ගමෙහි එම පාරේ ම වම් අත පැත්තේ පිහිටි එම දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2,000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු: (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී.බී.ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක. 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක - 0777-378441 / 0714-424478
ෆැක්ස් - 0112-509442

07-966

---

සංශෝධනයයි

**මහජන බැංකුව - පිළියන්දල ශාඛාව**

2017.07.07 වැනි දින අංක 2027 *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 07-222 දරන නිවේදනයේ දේපළට පිවිසීම සංශෝධනය කිරීම

*දේපළට පිවිසීම*.- පිළියන්දල නගරයේ සිට මොරටුව පාරේ ගිය පසු මෙම දේපළ වම්පස ප්‍රධාන පාරට මුහුණලා පිහිටා ඇත. (මෙම දේපලේ සිට සුවාරපොළ හන්දියට මීටර් 150 පමණ වේ) තුන්මහල් වාණිජ ගොඩනැගිල්ලක් සහ දෙමහල් ගොඩනැගිල්ලක් ඇත.

ඊ. එස්. රාමනායක.

07-986

---

HNB 250 - 17

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොල්ලුපිටිය ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2014 මැයි 30 වැනි දින සහතික කළ අංක 4874 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ධම්මික හෙට්ටිආරච්චි යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017ක් වූ අගෝස්තු මස 29 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර නුගේගොඩ

519 බී දරන ග්‍රාම නිලධාරි වසමේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නුගේගොඩ හි පිහිටි නිර්මාණ මාවතේ වරිපනම් අංක 227/18 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කේ. පී. ඔකඳපොල විසින් මැන සාදන ලද 2004 සැප්තැම්බර් මස 08 වැනි දින අංක 395/2004 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් එක්ස්. වයි. වශයෙන් දැක්වෙන ඉඩම් කොටස විශාලත්වය පර්චස් හතයි දශම දෙකයි පහයි (අ. 0, රූ. 0පර්. 7.25)

ඉහත කී ඉඩම් නැවත මැනීමෙකින් පසු මෙසේ විස්තර කෙරේ. ඉහත කී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර නුගේගොඩ 519 බී දරන ග්‍රාම නිලධාරි වසමේ සල්පිටි කෝරලේ පල්ලේපත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නුගේගොඩ හි පිහිටි නිර්මාණ මාවතේ වරිපනම් අංක 227/18 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද 2007 ජුනි මස 22 වැනි දින පිළියෙල කරන ලද දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස විශාලත්වය පර්චස් හතයි දශම බිංදුවයි පහයි (අ. 0 රූ, 0 පර්. 7.05)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.06.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2017.06.27 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - නුගේගොඩ මං සංධියේ සිට නාවල පාරේ නාවල දෙසට කි. මී. 1.4ක් පමණ ගොස් නිර්මාණ මාවතට වමට හැරී (හරියටම කොළඹගේ මාවත ඉදිරියෙන්) මීටර් 150ක් පමණ ගියවිට නුගේගොඩ නාවල පාරේ වරිපනම් 227/8 දරන දේපළ එම පටුමගේ දකුණත පැත්තේ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහය (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු .- (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක - 0777-378441 / 0714-424478, 0112-509442
ෆැක්ස් - 0112-509442.

07-967

---

HNB 251 - 17

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බම්බලපිටිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2014 නොවැම්බර් මස 26 වැනි දින සහතික කළ අංක 2421 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්ද වූ ද, 2016 ජුනි මස 13 වැනි දින සහතික කළ අංක 2929 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම සෙබස්තියන් රමේෂ් සහ රාමසාමි ඩයනා යන අය ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017ක් වූ අගෝස්තු මස 29 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී සරණංකර 538 සී දරන ග්‍රාම නිලධාරි වසමේ බටහිර කලුබෝවිල හි පිහිටි හාතිය මාවතේ වරිපනම් අංක 43/5 දරන කැටකැලගහ ඕවිට සහ මීගහකුඹුර කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 2014 මාර්තු මස 30 වැනි දින අංක 6740 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 15 සී වශයෙන් දැක්වෙන ඉඩම් කොටස විශාලත්වය පර්චස් දෙළහයි දශම පහයි (අ. 0 රූ. 0 පර්. 12.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී සරණංකර 538 සී දරන ග්‍රාම නිලධාරි වසමේ බටහිර කලුබෝවිල හි පිහිටි හාතිය මාවතේ වරිපනම් අංක 43/5 දරන කැටකැලගහ ඕවිට සහ මීගහකුඹුර කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 2004 මාර්තු මස 30 වැනි දින අංක 6740 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 15 ඩී වශයෙන් දැක්වෙන ඉඩම් කොටස විශාලත්වය පර්චස් බිංදුවයි දශම පහයි පහයි (අ. 0 රූ. 0 පර්. 0.55) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු අයි. ඩී. ඩී. හෙට්ටිගේ විසින් 2014 මාර්තු 30 වැනි දින සාදන ලද අංක 2694 දරන පිඹුරේ නිරූපිත ලොට් 16 සහ 17 මතින් ප්‍රවේශ අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.06.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2017.06.27 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොහුවල මංසන්ධියේ සිට දෙහිවල පාරේ පන්සල පාර දක්වා මීටර් 200ක් පමණ ගමන් කොට පන්සල පාරට දකුණට හැරී හාතිය පාර දක්වා මීටර් 500ක් පමණ ගොස් හාතිය පාරට දකුණට හැරී මීටර් 400ක් පමණ පද්මාරාම උද්‍යානය දක්වා ගමන් කරන්න. අවසාන වශයෙන් දකුණට හැරී රත්නාරාම උද්‍යානයේ මීටර් 100ක් පමණ ගියවිට එම පාරේ වම් අත පැත්තේ පිහිටි වරිපනම් අංක 43/5 ලෙස ඇති අදළ දේපළට ළඟා විය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු .- ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක - 0777-378441 / 0714-424478, 0112-509442.
ෆැක්ස් - 0112-509442.

07-968